# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1842/20 – 2013 දෙසැම්බර් 27 වැනි සිකුරාදා – 2013.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/21/39/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

1. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, නො. 493/1, දෙවන මහල, ටී. බී. ජයා මාවත, කොළඹ 10, 2. ස්වාධීන සේවක වෘත්තීය සමිතිය, අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, නො. 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, නො. 570/බී/1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

1A – G 018776 – 175 (2013/12)

*සැ.යු.– මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.*

මගේ යොමු අංකය: IR/21/39/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

1. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, නො. 493/1, දෙවන මහල, ටී. බී. ජයා මාවත, කොළඹ 10, 2. ස්වාධීන සේවක වෘත්තීය සමිතිය, අංක 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, නො. 45, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වැඩවර්ජනයට පාදක වී ඇති එහි නාරාහේන්පිට කර්මාන්තශාලාවේ සේවය කරන කේ. බන්දුසිරි මහතාගේ වැඩ තහනම් කිරීම සහ එල්. පී. සුනන්ද මහතා අනිවාර්ය නිවාඩු යැවීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිලිබඳව වේ.

**වී බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.
01 - 373

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.